**ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතිය -2021/2022**

---

ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතියේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් මාස 15 සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා Agence Francaise De Development අතර 2015 ඔක්තෝබර් 02 දින එළඹි අංක සී්එල්කේ 101104 එල් දරන ණය පහසුකම් ගිවිසුම සහ 2016 නොවැම්බර් 18 දින එළඹි අංක සීඑල්කේ 101104 එල් දරන සංශෝධිත ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (ඌ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

---

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම් අනුව, විදුලිබල අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පුනර්ජනනීය බලශක්තිය ජාලක අවශෝෂණ ධාරිතාව ඉහල නැංවීම සහ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ පෞද්ගලික අංශයේ දායකත්වය සඳහා අවස්ථාව ලබාදීම මගින් ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය, රාගල යන ප්‍රදේශවල කිලෝ වොට් 132/33 ක උප පොළවල් ඉදිකිරීම යන සංරචක 4 ක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 6,660.10 කට සමාන යුරෝ මිලියන 41.10 ක් වන අතර ඉන් රු. මිලියන 4,865.90 කට සමාන යුරෝ මිලියන 30 ක් මූල්‍යයනය කිරීමට Agence Francaise De Development එකඟ වී තිබුණු අතර උපකරණ සහ වැඩ සැපයීම් කොන්ත්‍රත්තුවේ කොටසක් මුල්‍යානය කිරීමට භාවිතා කෙරේ. ඉතිරි මුදල වන රු. මිලියන 1,794.20 කට සමාන යුරෝ මිලියන 11.1 ක් මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර 2019 ඔක්තෝබර් 30 දින වන විට තාක්ෂණිකව නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 යටතේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2022 මාර්තු 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 15 සඳහා ව්‍යාපෘති වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදි. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම, හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමකට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරන අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ සහ ලංවිම වාහනවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 7සිට 14 දක්වා වෙනස් කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ ක්ෂයවීම්වලින් රු. මිලියන 19.25 ක් අඩු කර තිබුණි. කෙසේ වෙතත්, මෝටර් රථවල ආයු කාලයෙහි වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල නිසි පරිදි අනාවරණය කර නොතිබුණි. | 19.25 | කෙරීගෙන යන වැඩ සහ ලංවිම දායකත්වය මත මූල්‍ය බලපෑමේ ප්‍රමාණාත්මක නොවන බව සැලකිල්ලට ගනිමින්, මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක සංඛ්‍යා සඳහා ගැලපීම් සිදු කර නොමැත. | පරිශීලකයින් සඳහා තොරතුරු සැපයීම සඳහා ආයු කාලය ඇස්තමේන්තු කිරීමේ වෙනස්කම් නිසි ලෙස හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | 2022 මාර්තු 31 වන දිනට AFD අරමුදල් භාවිතා කිරීමේ අවසාන දිනය අවසන් වූ පසුවත් ඉඩම් සහ ඉන්ධන තැන්පතු නිරවුල් නොවී පැවතුනි. තවද, කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධනිත කිරීම 2022 ජූනි 28 දක්වා අවසන් කර නොතිබුණි. | 2.8 | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා බලධාරීන් සමඟ පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලබයි. විවිධ ඉන්ධන පිරවුම්හල්වල ඉන්ධන තැන්පතු කර ඇත. දෝෂ වගකීම් කාලය තවමත් ක්‍රියාත්මක වන බැවින්, තැන්පතු ස්ථානීය පරීක්ෂණ අරමුණු සඳහා තබා ඇත. තැන්පතු නිදහස් කර ගැනීම සඳහා අදාළ ඉන්ධන පිරවුම්හල් වෙත ලිපි යවා ඇත.<br><br>දෝෂ වගකීම් කාලය අවසන් වන තුරු ව්‍යාපෘතිය අවසන් කිරීම සිදු කළ නොහැක. | ව්‍යාපෘති කාලය අවසන් වීමට පෙර තැන්පතු නිදහස් කර ගත යුතුය. |
| (ඇ) | රු. මිලියන 133.08 ක පොලී මුදල් වැනි ණය ගැනීම් පිරිවැය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාල සීමාව තුළ රජය විසින් දරන ලද රු. මිලියන 102.53 ක බැඳීම් ගාස්තුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 235.6 | මෙම ණය සඳහා අදාළ බැඳීම් ගාස්තු සහ පොලී මුදල් අමාත්‍යාංශය විසින් ගෙවනු ලබයි. එය ලංවිමට බාහිර වෙනත් ආයතනයක් විසින් දරනු ලබන බැවින් එය ව්‍යාපෘතියට අදාල වුව ද නිසි ගණුදෙණු පදනමක් නොමැතිව පිරිවැයක් ලෙස ගිණුම්ගත කළ නොහැක. | ඉදිකිරීම් කාලය දක්වා වූ සියලුම ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 2016/03 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය. | අදාළ සේවකයින්ගේ වැටුප්වලින් අඩු කිරීමෙන් තොරව 2020 ඔක්තෝම්බර් දක්වා උපයන විට ගෙවන (PAYE) බද්ද සහ බදු මත බද්ද ලෙස ව්‍යාපෘතිය විසින් රු. 55,233 ක් එහි සතු අරමුදල්වලින් ගෙවා තිබුණි. | 2020 ඔක්තෝබර් දක්වා පමණක් ලංවිම විසින් PAYE බදු දරා ඇත. මණ්ඩලය විසින් ගත් තීරණයට අනුව 2020 නොවැම්බර් මාසයේ සිට අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සේවකයින් විසින් දරන ලදි. | පුද්ගල බද්ද මණ්ඩලය විසින් දරනු වෙනුවට සේවකයින්ගේ වැටුපෙන් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම හෝ ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට ලක් කිරීම හෝ කර නොතිබුණි. | රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් අභ්‍යන්තර විගණනය සිදු කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයා විසින් ව්‍යාපෘතිය විගණනය කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 23 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2016/1 හි 4.3 වගන්තිය | චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව, ලබා නොගත් නිවාඩු සඳහා දීමනා සහ ප්‍රසාද දීමනා ලෙස 2022 මාර්තු 31 දක්වා එකතුව රු. 43,124,643 ක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | මෙය ලංවිම ප්‍රතිපත්තියට සහ සියලුම ලංවිම සේවකයින්ට අදාල මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුවේ. | චක්‍රලේඛයේ උපදේශයට අනුකූල වීම. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| සංරචකය/උප සංරචකය | 2022 මාර්තු 31 දිනට | | විගණන නිරීක්ෂණය |
|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | |
| <u>මාලිබොඩ</u> | | | කුඩා ජල විදුලි බලාගාර මගින් ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණය කිරීමේ |
| - කොටුමා උපපොළ | 100 | 100 | |
| - සම්ප්‍රේෂණ මාර්ගය | 100 | 100 | |
| <u>රාගල</u> | | | |

| | | | |
|---|---|---|---|
| - කොටුමා උපපොළ | 100 | 100 | ප්‍රමාදයක් පැවතුණි. |
| - සම්ප්‍රේෂණ මාර්ගය | 100 | 100 | |
| <u>නාවලපිටිය</u> | | | |
| - කොටුමා උපපොළ | 100 | 100 | |
| - සම්ප්‍රේෂණ මාර්ගය | 100 | 100 | |
| <u>වේවැල්වත්ත</u> | | | |
| - කොටුමා උපපොළ | 100 | 100 | |
| - සම්ප්‍රේෂණ මාර්ගය | 100 | 100 | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

සියලුම ව්‍යාපෘති සංරචක (කොටුමා උපපොළවල් සහ අදාළ සම්ප්‍රේෂණ මාර්ග සඳහා) 2021/06/25 වන විට අවසන් කර ඇති අතර ලංවිම වාණිජ මෙහෙයුම් සඳහා භාවිතා කර ඇත.

නිම කිරීම ප්‍රමාද වීමට හේතු:

1. භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදනය සඳහා වූ සමහර ටෙන්ඩර් අවලංගු කිරීම.
2. සම්ප්‍රේෂණ මාර්ග සහ කොටුමා උපපොළ ඉඩම් හි අනපේක්ෂිත ගල් පිපිරවීම.
3. 2019 අප්‍රේල් මාසයේ පාස්කු ප්‍රහාරය, Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් ගමන් සීමා කිරීම්, දේශීය ද්‍රව්‍ය හිඟය (පිපිරුම් ද්‍රව්‍ය, සිමෙන්ති, වැලි, වැරගැන්වීම ආදිය), විදේශීය කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකාවෙන් පිටවීම.
4. දේශීය ද්‍රව්‍ය, ශ්‍රමය ආදියෙහි මිල විශාල ලෙස ඉහළ යාම.
5. ඉදිකිරීම් කාලය තුළ අයහපත් කාලගුණයක් පැවතුනි. (කොටුමා උපපොළවල් සහ සම්ප්‍රේෂණ මාර්ග වැඩබිම්වල ගංවතුර)

**විගණකගේ නිර්දේශය** ලංවිම සැලැස්ම සපුරාලීම සඳහා නියමිත වේලාවට කටයුතු අවසන් කළ යුතුය.

**3.2 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු**

| අංකය | ඉඩම් කට්ටි සංඛ්‍යාව - අත්පත් කර ගැනීමට අපේක්ෂිත | 2022 මාර්තු 31 දිනට අත්පත් කර ගැනීම් | විගණන නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | රාගල කොටුමා උපපොළ | හිමිකාරීත්වය තවමත් පවරා ගෙන නොමැත. | ඉඩම් අයිතිය පවරා නොගන්නේ නම් ඉදිරියේදී ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු මතු වනු ඇත. |
| (ආ) | නාවලපිටිය කොටුමා උපපොළ | | |
| (ඇ) | මාලිබොඩ කොටුමා උපපොළ | | |
| (ඈ) | වේවැල්වත්ත කොටුමා උපපොළ | | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

කොටුමා උපපොළවල් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කරනු ලබන අතර එය දීර්ඝ ක්‍රියාවලියකි. ලංවිම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග මෙම ක්‍රියාවලිය අඛණ්ඩව පසුවිපරම් කරයි. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලියට ලංවිමට සීමිත ප්‍රවේශයක් පවතී.

**විගණකගේ නිර්දේශය**

ව්‍යාපෘතිය නිම කිරීමට පෙර ඉඩම අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.